© සියලු ම හිමිකම් ඇවිරිණි

අනු අංකයඃ ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය

## ශිල්පීය අදියර
## 2008 සැප්තැම්බර් විභාගය

විභාග දිනය : 2008 සැප්තැම්බර් 21 පිටු ගණන : 06
විභාග වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30 ප්‍රශ්න ගණන : 09

අයදුම්කරුවන්ට උපදෙස්ඃ

1. නියමිත කාලය පැය 3 කි.
2. I කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II කොටසේ A කාණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද, B කාණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද උත්තර සපයන්න.
3. උත්තර එක් භාෂාවකින් (සිංහල) පමණක් ලියන්න.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර ව්‍යාපාර | (ECN / 505) |

---

### I කොටස

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුරු, සපයා ඇති උත්තර පත්‍රයේ පැන්සලකින් සඳහන් කරන්න.

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 20)*

(1) ශිෂ්‍යාවක් පසුගිය මාසයට තමාගේ ආදායම හා වියදම සඳහන් කරයි. මේ අවස්ථාවේ දී මුදලින් ඉටුවන කාර්යය කුමක් ද?
(a) විනිමය මාධ්‍යය
(b) කල්තබා ගෙවීමේ කාර්යය
(c) අගය තක්සේරු කිරීම
(d) අගය එක්රැස් කිරීම

(2) වෘත්තීය සමිතියක් මගින් වැඩි වැටුප් ලබාගැනීමේ උත්සාහයට පහත සඳහන් වගන්තිවලින් කුමන වගන්තිය අදාළ නොවේ ද?
(a) පාරිභෝගික ඉල්ලුම
(b) කම්කරු ඉපැයුම
(c) ලාභය
(d) විරැකියාව

(3) ව්‍යාපාර සංවිධානයක අයිතිවාසිකම හා පාලනය වෙන්වීම යනුවෙන් හැඟෙන්නේ කුමක් ද?
(a) ශ්‍රමිකයන්ගේ පාලනය වැඩිවීම
(b) ව්‍යාපාර සංවිධාන තුළට රජයේ මැදිහත්වීම වැඩිවීම
(c) අයිතිකරුවන් නොවන අය කළමනාකරුවන් ලෙස පත් කිරීම.
(d) පුද්ගලික ව්‍යවසාය පුළුල් කිරීම.

(4) බොහෝ රටවල බැංකු ව්‍යාපාරය පාලනය කරන ආයතනය කුමක් ද?
(a) මධ්‍යම බැංකුව
(b) වානිජ බැංකු
(c) ආයෝජන බැංකු
(d) ලෝක බැංකුව

(5) බොහෝ රටවල් එම ආර්ථිකයේ වෙළඳපොල බලවේග පුළුල් කර තිබේ. මේ කාර්යයෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵලය කුමක් ද?
(a) ආර්ථික කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම
(b) ආදායමේ සමානකම් ඇති කිරීම
(c) අඩු විශේෂීකරණය
(d) වැඩි රාජ්‍ය පාලනය

(6) ඉදිරි සිරස් සංයෝජනයට උදාහරණයක් වන්නේ,
(a) මෝටර් රථ නිෂ්පාදයකු ටයර් නිෂ්පාදනයක් ගැනීම
(b) ටයර් නිෂ්පාදකයෙක් මෝටර් රථ අලෙවි ව්‍යාපාරයක් ගැනීම
(c) ටයර් නිෂ්පාදකයෙක් රබර් වතු වගාවක් ගැනීම
(d) ටයර් නිෂ්පාදකයෙක් තවත් ටයර් නිෂ්පාදනයක් ගැනීම

(7) ආණ්ඩුව එහි විශ්‍රාම ගෙවීම් විශ්‍රාමිකයන්ට වැඩි කිරීමෙන් කුමක් ක්ෂණිකව වැඩි වේද?
(a) දළ ජාතික නිෂ්පාදිතය
(b) රජයේ වියදම
(c) අයවැය අතිරික්තය
(d) ජීවන වියදම

(8) පහත සඳහන් ප්‍රස්තාරයෙන් රටේ ආර්ථික වර්ධනය පෙන්නුම් කරයි.




මින් කුමන වගන්තිය සත්‍ය වේද?
(a) ද.ජා.නි. 1996-97 දක්වා පහත වැටිනි
(b) ද.ජා.නි. 1998 අඩු විය
(c) ද.ජා.නි. 1995-1996 දක්වා වැඩි විය
(d) 1996-1999 දක්වා ආර්ථික වර්ධනයක් නොමැත

(9) ව්‍යාපාරයක් බහුජාතික සමාගමක් වශයෙන් හැඳින්වීමට කුමක් අවශ්‍ය ද?
(a) විවිධ භාණ්ඩ නිෂ්පාදනය
(b) එහි නිමැවුමෙන් වැඩි ප්‍රමාණයක් අපනයනය කිරීම
(c) එහි නිපදවීම් පරිමාණය වැඩි කිරීම
(d) එහි නිෂ්පාදනය විවිධ රටවල නිපදවීම

(10) කුඩා ව්‍යාපාරිකයකුට විශාල ව්‍යාපාරිකයකු සමග තරග කිරීමට කුමන වාසියක් හිමි විය යුතු ද?
(a) පහසු පිහිටුවීමක්
(b) විවිධ භාණ්ඩ වර්ග
(c) අභ්‍යන්තරික පරිමාණ වාසි
(d) ජාතික ප්‍රචාරය

(11) වාණිජ බැංකුවක් රටක මධ්‍යම බැංකුව ලෙස ක්‍රියා කිරීමට පත් කර තිබේ නම්, කුමන නව කාර්යයක් හිමි විය යුතු ද?
(a) මූල්‍ය ප්‍රතිපත්ති පාලනය
(b) විදේශික විනිමය කටයුතු
(c) ණය මුදල්වලට සුරැකුම් ඇති කිරීම
(d) ද්‍රව්‍ය (liquid) වත්කම් තබාගැනීම

(12) වෘත්තීය සමිති කාර්යයන් අතුරෙන් ව්‍යාපාරයක් කෙරෙහි වඩාත් අසතුටුදායක ප්‍රතිඵලය විය හැක්කේ,
(a) නව තාක්‍ෂණය පිළිගැනීම
(b) වැඩිපුර දීමනාවන්ට එකඟ වීම
(c) රැකියාවෙන් අස්කරවීමට එකඟ නොවීම
(d) ව්‍යාපාරයේ ලාභ සහකරුවකු වීමට එකඟ වීම

(13)




ඉහත දක්වා ඇති රූපසටහනේ පෙන්නුම් කරන්නේ පළතුරුවලට ඇති ඉල්ලුමයි. කුමන හේතුවක් නිසා X සිට Y වලට ඉල්ලුම මාරු විය හැකි ද?
(a) ආශාවේ වෙනසක්
(b) පළතුරු මිල පහත වැටීමක්
(c) ආදායම වැඩි වීමක්
(d) සාර්ථක ප්‍රචාරණ ව්‍යාපාරයක්

(14) පහත සඳහන් වගුවේ X වල මිල, ඉල්ලුම හා සැපයුම දක්වයි.

| මිල රු. | ඉල්ලුම (ටොන්) | සැපයුම (ටොන්) |
|---|---|---|
| 20 | 16 | 10 |
| 30 | 12 | 12 |
| 40 | 10 | 14 |

රජය රු. 40 ක අවම මිලක් දැමුවහොත් කුමක් සිදු විය හැකි ද?
(a) X හි මිල පහළ වැටීම
(b) X වල හිඟකමක් ඇති වීම
(c) X අතිරික්තයක් ඇති වීම
(d) X වලට ඉල්ලුම් ලැයිස්තුවක් ඇති වීම

(15) පෙ.ව. 9.00 ට පෙර ගමන්වාරයන්හි ඉල්ලුම අනම්‍ය බවත්, පෙ.ව. 9.00 ට පසු නම්‍ය බවත් බස්රථ සමාගම දනී.

ඒ සමාගමේ මුළු ආදායම වැඩි කිරීමට නම්,

(a) සියලුම ගාස්තු වැඩි කළ යුතුයි
(b) පෙ.ව. 9.00 ට පෙර ගාස්තු වැඩි කළ යුතුයි
(c) සියලුම ගාස්තු අඩු කළ යුතුයි
(d) පෙ.ව. 9.00 ට පෙර ගාස්තු අඩු කළ යුතුයි

(16) පහත වගුවෙන් පෙන්නුම් කරන්නේ පුද්ගලයකුගේ විවේකය හා ආදායම අතර සම්බන්ධතාවයයි.




X සිට Y වලට විතැන් වීමේ දී ලබන වැඩිපුර ආදායමෙන් පුද්ගලයකුට ඇති විය හැකි ආවස්ථික පිරිවැය කුමක් ද?

(a) රු. 20
(b) රු. 80
(c) පැය 4 ක විවේකය
(d) පැය 8 ක විවේකය

(17) පහත සඳහන් වත්කම්වලින් ''ඉඩම්'' යන නිෂ්පාදන සාධකයකට හිමි නොවන වත්කම කුමක් ද?

(a) කැලෑවක්
(b) ස්වභාවික වරායක්
(c) තෙල් ලිඳක්
(d) මහා පාරක්

(18) බාහිර මහා පරිමාණ ලක්‍ෂණයක් විය හැක්කේ කුමක් ද?

(a) වෙනත් සමාගම්වලින් යන්ත්‍ර මිල දී ගැනීම
(b) වෙනත් සමාගම් සමඟ පර්යේෂණ පැවැත්වීම
(c) වෙනත් සමාගම්වලට මුදල් ණයට දීම
(d) නිපැයුම් වෙනත් සමාගම්වලට විකිණීම

(19) ඒකාධිකාරී වෙළඳපොලක විශාල ව්‍යාපාරයකට අහිමි නොවන ලක්‍ෂණයක් වන්නේ,

(a) මහා පරිමාණ ලක්‍ෂණ ලැබීම
(b) රජයේ අවධානය යොමු වීම
(c) අධික මිල අයකිරීම
(d) වෙළඳපොලෙහි අධික තරඟයකට මුහුණ පෑම

(20) ආර්ථික වර්ධනයේ අවාසියක් වන්නේ මින් කුමක් ද?

(a) රජයේ බදු ආදායම අඩුවීම
(b) සම්පත් හිඟකම
(c) සේවා වියුක්තිය වැඩිවීම
(d) ජනගහනයේ ජීවන තත්ත්වය පහත වැටීම

***(ලකුණු 01 x 20 = ලකුණු 20)***

**I කොටස අවසානයි**

## I කොටස

### A අංශය

ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු සපයන්න.

**<u>ප්‍රශ්න අංක 02 *(ලකුණු 20)*</u>**

සෑම ආර්ථිකයකටම මුහුණ පෑමට සිදුවන්නේ එකම ආර්ථික ප්‍රශ්නයකට ය. නමුත් ආර්ථිකයක් තවත් ආර්ථිකයකින් වෙනස් වන්නේ ඒවාට ඇති සැලසුම් නිසා ය.

(a) රටක මූලික ආර්ථික ප්‍රශ්ණ කවරේද? (ලකුණු 03)

(b) වෙළඳ ආර්ථිකයක ප්‍රධාන ලක්‍ෂණ විස්තර කරන්න. (ලකුණු 07)

(b) සැලසුම් ආර්ථික ක්‍රමයක් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 10)
(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 03 *(ලකුණු 20)*</u>**

(a) ඉල්ලුම් වක්‍රය සංකෝචනය වීම හා ප්‍රසාරණය වීම යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? ඊට හේතු මොනවා ද? රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(b) ඉල්ලුම් වක්‍රය විතැන්වීම යනු කුමක් ද? ඊට හේතු මොනවා ද? රූපසටහන් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 10)
(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 04 *(ලකුණු 20)*</u>**

(a) ව්‍යාපාරයකට ඒකාධිකාරී තත්ත්වයක් ලැබෙන අයුරු විස්තර කරන්න. (ලකුණු 12)

(b) ඒකාධිකාරී ව්‍යාපාරයක වෙළඳපොලේ සමතුලිතතාවය රූපසටහනක් ඇඳ පැහැදිලි කරන්න.
(ලකුණු 08)
(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 05 *(ලකුණු 20)*</u>**

මේවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(a) ආවස්ථික පිරිවැය (ලකුණු 05)

(b) නිෂ්පාදන හැකියා මායිම (ලකුණු 05)

(c) අතිරික්ත ඉල්ලුම (ලකුණු 05)

(d) අදෘශ්‍යමාන හස්තය (ලකුණු 05)
(මුළු ලකුණු 20)

A අංශය අවසානයි

**B** අංශය

ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු සපයන්න.

**<u>ප්‍රශ්න අංක 06 *(ලකුණු 20)*</u>**

(a) උද්ධමනයක් ඇති කළ හැකි ප්‍රධාන හේතු මොනවා ද? (ලකුණු 09)

(b) උද්ධමනය නිසා ආර්ථිකයේ ඇති විය හැකි ප්‍රතිඵල මොනවා ද? (ලකුණු 11)
(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 07 *(ලකුණු 20)*</u>**

(a) ජාත්‍යන්තර වෙළඳාම නිසා ලැබිය හැකි වාසි මොනවා ද? (ලකුණු 09)

(b) මෙවැනි වාසි තිබිය දී, සමහර රටවල් ආරක්ෂණවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ ඇයි?
(ලකුණු 08)

(c) ආරක්ෂිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 4 ක් දෙන්න. (ලකුණු 03)
(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 08 *(ලකුණු 20)*</u>**

(a) රටක ආර්ථික වර්ධනය යනු කුමක් ද? (ලකුණු 04)

(b) ආර්ථික වර්ධනයේ පිරිවැයන් මොනවා ද? (ලකුණු 08)

(c) ආර්ථික වර්ධනය නිසා ලැබිය හැකි යහපත් ප්‍රතිඵල විස්තර කරන්න. (ලකුණු 08)
(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 09 *(ලකුණු 20)*</u>**

(a) ජාතික ආදායම නිර්වචනය කර චක්‍රීය ආදායම් ප්‍රවාහය සඳහන් කර රූපසටහනක් දෙන්න.
(ලකුණු 08)

(b) ජාතික ආදායම තක්සේරු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 08)

(c) ජාතික ආදායම සම්පාදනය කරන විට මුහුණ පෑමට සිදුවන ගැටලු 2 ක් දක්වන්න. (ලකුණු 04)
(මුළු ලකුණු 20)

B අංශය අවසානයි

II කොටස අවසානයි

**ප්‍රශ්න පත්‍රය අවසානයි**